# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1793/25 - 2013 ජනවාරි මස 19 වැනි සෙනසුරාදා - 2013.01.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

1990 අංක 4 දරන පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) වගන්තිය හා 4 වගන්තිය ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමඟ කියවෙන 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 277 වගන්තිය ද යටතේ කරනු ලබන නිවේදනය

දකුණු පළාතේ පළාත් සභාවේ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය, ෂාන් විජයලාල් ද සිල්වා වන මා විසින් දකුණු පළාත් සභාවේ 1990 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියෙන් සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවෙන 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 277 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගාල්ල මහ නගර සභාවේ නගරාධිපති වන අ. අ. මෙත්සිරි ඇලෙක්සැන්ඩර් ද සිල්වා මහතා ගාල්ල මහ නගර සභාවේ නගරාධිපති වශයෙන් කටයුතු කිරීමේ දී 1990 අංක 4 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීම පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) වගන්තිය සහ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 277 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකර ඇත්දැයි පරීක්ෂා කර බැලීම සඳහා පත් කරන ලද විශ්‍රාම ලත් අධිකරණ නිලධාරියාගේ පරීක්ෂණ වාර්තාවෙන් අනාවරණය වූ කරුණු අනුව එකී ගාල්ල මහ නගර සභාවේ නගරාධිපතිවරයා වන අ. අ. මෙත්සිරි ඇලෙක්සැන්ඩර් ද සිල්වා මහතා විසින් 1990 අංක 4 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලන අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) වගන්තිය සහ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 277 වගන්තිය යටතට ගැනෙන වරදවල් සිදුකර ඇති බවට සෑහීමකට පත් වී, එකී 1990 අංක 4 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) වගන්තිය ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවෙන 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 277 (i) (1) වගන්තිය ද අනුව ගාල්ල මහ නගර සභාවේ නගරාධිපති වන අ. අ. මෙත්සිරි ඇලෙක්සැන්ඩර් ද සිල්වා මහතා ගාල්ල මහ නගර සභාවේ නගරාධිපති ධූරයෙන් සහ සභික ධූරයෙන් පහ කරමි.

ෂාන් විජයලාල් ද සිල්වා,<br>
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන,<br>
ජල සම්පාදන හා ජලාපවහන, විදුලි බල, ඉංජිනේරු සේවා,<br>
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය,<br>
දකුණු පළාත.

2013 ජනවාරි මස 17 වැනි දින.

02-191

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 001528 — 430 (2013/01)